# 6 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

## ඒකකය 1 - අපේ පාසල

### කාර්ය සාධනය හා පිළිතුරු පත්‍රය

1) පාසලේ ඉතිහාසය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද ?

   පාසල ආරම්භ වූ දින සිට මේ දක්වා විකාශනය වූ ආකාරය පිළිබඳ තොරතුරු

2) පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපකාරී වන මූලාශ්‍ර මොනවාද ?

- පාසලේ විවිධ ස්ථානවල ඇති සමරු ඵලක
- ගමේ හෝ නගරයේ පුස්තකාලවල පැරණි ලිපි ලේඛන, පින්තූර හා ඡායාරූප
- විශ්‍රාමික විදුහල්පතිවරුන්ගෙන් හා ගුරුවරුන්ගෙන් ලබා ගතහැකි තොරතුරු
- පාසලේ පවත්වාගෙන යන ලිපි ලේඛන

3) පාසලේ සංවිධාන ව්‍යුහය ලෙස අදහස් වන්නේ කුමක්ද ?
   - පාසලේ පරිපාලන හා සංවර්ධන කටයුතු සංවිධානය වී ඇති ආකාරය

4) විදුහල්පති විසින් සිදුකරන ප්‍රධාන කාර්යභාර්ය 2 නම් කරන්න
   - පාසලේ ප්‍රධානියා වශයෙන් කටයුතු කිරීම
   - ළමයින් ඇතුළත් කිරීම,ඔවුන් පන්තිවලට බෙදීම,ගුරුවරුන් නම් කිරීම

5) ගුරුවරුන් විසින් සිදු කරන ප්‍රධාන කාර්යන් දක්වන්න

- ශිෂ්‍ය ශිෂ්‍යාවන් හික්මවීම හා විනයවත් කිරීම
- ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නිවැරදි මග පෙන්වීම හා චරිත සංවර්ධනය
- පන්ති කාමරය තුළ ප්‍රියජනක පරිසරයක් පවත්වාගෙන යාම
- ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සමානාත්මතාවයෙන් කටයුතු සැලකීම

6) ශිෂ්‍යයන් විසින් සිදුකළ යුතු කාර්යන් නම් කරන්න.

- දිනපතා පාසලට පැමිණීම
- හොඳින් ඉගෙනීමේ කටයුතුවල යෙදීම
- විදුහල්පති ඇතුලු ආචාර්ය මණ්ඩලයට ගෞරව කිරීම
- පාසලේ ගෞරවය ආරක්ෂා වන ලෙස සැම විටම හැසිරීම

7) විදුහල්පති විසින් සිදුකරන ප්‍රධාන කාර්යභාර්ය 2 නම් කරන්න

- පාසලේ ප්‍රධානියා වශයෙන් කටයුතු කිරීම
- ළමයින් ඇතුළත් කිරීම,ඔවුන් පන්තිවලට බෙදීම,ගුරුවරුන් නම් කිරීම

8) අනධ්‍යන කාර්ය මණ්ඩලය ට අයත් කාර්යන් මොනවාද ?

- පාසලේ කටයුතු පවත්වාගෙන යාමට විදුහල්පතිට හා ගුරු මණ්ඩලයට සහාය වීම
- පාසලේ ළමයින්ගේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සපයා දීමට
  සහාය වීම
- පාසල් භූමියේ පවිත්‍රතාව හා අලංකාරය පවත්වා ගෙනයාමට සහාය වීම

9) පාසලේ සංවිධාන ව්‍යුහය තුළ ඇති වෙනත් කමිටු නම් කරන්න

- ක්‍රීඩා කමිටුව
- සුබසාධක කමිටුව
- ශිෂ්‍ය නායක මණ්ඩලය
- පරිසර කමිටුව